මොරටුව මහා නගර සභාව - 2022

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 2.1 යටතේ දක්වා තිබුණද, මෙම නව ප්‍රමිතියට අනුව ගිණුම් පවත්වාගෙන යාමට අවශ්‍ය ආකෘති පත්‍ර හා කේත අංක, බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක LGD/09/2019 හා 2019 දෙසැම්බර් 31 දිනැති සහ ඊට අදාළව නිකුත් කරන ලද සංශෝධන චක්‍රලේඛ මඟින් ලබාදී තිබුණි. එහෙත් මොරටුව මහා නගර සභාව විසින් 2022 වර්ෂයේ ගිණුම් පවත්වා ගෙන යාම සඳහා ද එම චක්‍රලේඛ මඟින් හඳුන්වා දෙන ලද ආකෘති සහ කේත අංක කිසිවක් භාවිතා කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමද මෙහි සඳහන් ගිණුම්කරණ ප්‍රමිතය සහ රීති අංක 84 අනුව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ මඟින් හඳුන්වා දෙන ලද ආකෘති භාවිතා කර 2022 ගිණුම් සකස් කර ඇති බව. | පාළාත් පාලන කොමසාරිස් විසින් හඳුන්වා දී ඇති අංක සහ ආකෘති අනුව ගිණුම් පොත් පත් පවත්වා ගත යුතුය. |

#### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීම, වත්කම් ක්ෂය කිරීම් සහ වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ආදායම හඳුනා ගැනීම ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණි. | ඉදිරි කාලයේදී නිවැරදිව හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම අනුව හඳුනා නොගත් බැර ශේෂයන් 305 හි වටිනාකම් වූ රු.192,332 ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තව දුරටත් පවතින්නේ රු.192,332 ක ශේෂයක් වන අතර එම ශේෂය ඉදිරියේදී නිරවුල් කර ගන්නා බව. | හඳුනා නොගත් බැර ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

#### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැති වීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද වත්කම් ලේඛණ, කාල විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛණ, ශේෂ සනාථ | තව දුරටත් හිඟ ලේඛණ පරික්ෂා කර ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | ශේෂ තහවුරු සඳහා අවශ්‍ය උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

කිරීම් සහ භෞතික තොග විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා රු.164,101,841 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.7 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 156 | වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාද වීම මත අධිභාර පැන නැගී තිබූ අතර 2015 සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී සභාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවන ලද රු.1,088,565 ක අධිභාර මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගෙන නොතිබුණි. | කටයුතු කෙරෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 156 | අංක 1329 මුදල් දරන සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ රු.11,602,318 ක් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | සභාව විසින් ගෙවූ මුදල් නැවත අය කර ගැනීම සඳහා මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නිලධාරි තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇති අතර නිර්දේශ ලැබුණු පසු ඒ අනුව කටයුතු කරන බව. | කඩිනම් පරීක්ෂණ නිමකර නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 486 (i) ආ | 1998 සිට 2003 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් වටිනාකම රු.473,288 ක් වූ අගරු චෙක්පත් 85 කින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගෙන නොතිබුණි. | වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.90,675,820 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.136,192,585 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.21. ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) |
| වරිපනම් හා බදු | 213,357,880 | 206,930,699 | 261,364,133 | 293,898,809 | 219,250,000 | 209,908,617 | 108,074,820 | 310,103,404 |
| කුලී | 5,524,400 | 10,448,312 | 6,316,645 | 4,357,667 | 4,860,000 | 5783,533 | 5,177,498 | 3,124,678 |
| බලපත්‍ර ගාස්තු | 6,500,000 | 9,462,600 | 9,503,875 | 2,933,175 | 6,000,000 | 10,063,850 | 10,022,575 | 2,974,450 |
| වෙනත් ආදායම් | 594,000 | 669,763 | 647,957 | 678,305 | 544,000 | 655,423 | 646,544 | 658,706 |
| එකතුව | 225,976,280 | 227,511,374 | 277,832,610 | 301,867,956 | 230,654,000 | 226,411,423 | 123,921,437 | 316,861,238 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.293,898,809 ක් වූ අතර ඒ තුළ හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 453 කින් අයවිය යුතු වටිනාකම රු.105,603,527 ක් විය. | ඉදිරියේදී හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| (i) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය ) 254 (අ) 1 සහ 2 වන වගන්ති අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලින බදු දෙන දේපළ 258 කින් අයවිය යුතු හිඟ ශේෂය රු.4,151,326 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020, 2021 වර්ෂය සඳහා රු.522,679 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර 2023.03.31 දිනට හිඟයෙන් රු.2,479,308 ක මුදලක් අය කර ගැනීමට හැකි වූ අතර, දීර්ඝ | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කාලීනව පැවත එන ශේෂයන්ගේ එකතුවක් වන රු.1,118,969 ක මුදලක් කපා හැරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවා ඇති බව. | |
| (ii) | සභාව සතු බදු දෙන දේපළ 258 න් 08 ක් බදු දීමට කටයුතු කර නොතිබුණු අතර දේපළ 28 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මධ්‍යම වෙළඳපල කඩ කාමර 08 ක් නැවත බදු නොදීමට 2021.12.02 දිනැති මාසික සභා රැස්වීමේදී තිරණය කර ඇත. ඉතිරි දේපළ සඳහා නව තක්සේරුවක් ලබාගෙන ගිවිසුම්ගත වීම සඳහා කටයුතු කරන බව. | බදු ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිභාර | | |
| | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර 02 ක් වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.760,173 ක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර වලින් නිදහස් වූ මන්ත්‍රිවරු 06 දෙනා, අධිභාර ගෙවිය යුතු නමුත් මියගිය මන්ත්‍රිවරු හැර ඉතිරි අධිභාරකරුවන් විසින් මෙම සම්පූර්ණ මුදලම ගෙවිය යුතු බවට කරුණු යෙදී තිබුණු ද මහා නගර සභා ආඥා පනතේ විධිවිධානවලට පටහැනිව නිලධාරින් නිදහස් කිරීම හේතුවෙන් අධිකරණ ක්‍රියා මාර්ග සඳහා යොමු විමද ගැටලු සහගත බැවින් නාගරික කොමසාරිස් විසින් ආණ්ඩුකාර ලේකම්ගෙන් අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් සඳහා කරුණු විමසා ඇති බව. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වරිපනම් අංශයේ පරිගණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් විසින් පොදු මුරපදය (common pass word) භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10 කදී රු.105,893 ක් වටිනා බිල්පත් අවලංගු කර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මාණ්ඩලික නිලධාරියෙකු සතුව පැවතිය යුතු රහස් මුර පදය ද (Secret pass word) ව්‍යාජ ලෙස භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලාභය අය කර නොතිබුණි. | මූලික විමර්ශන වාර්තාව හා චෝදනා කෙටුම්පත පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත 2021.12.09 දින යොමු කර ඇති බව. | පරික්ෂණ කඩිනමින් නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභිකයකුගෙන් අයවිය යුතු හිඟ ඉන්ධන ශේෂය වූ රු.75,000 ක් සමාලෝචිත වර්ෂයේ ද අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතින බව. | අයවිය යුතු මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | 2019 සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු රු.27,172,234 ක වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | *විගණන නිරීක්ෂණය* | *සභාවේ අදහස් දැක්වීම* | *නිර්දේශය* |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ 06 දෙනෙකුගෙන් රු.258,303 ක් ද, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 28 දෙනෙකුගෙන් රු.678,818 ක් ද වශයෙන් එකතුව රු.3,671,001 ක් වූ සේවක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ණය කඩිනමින් අය කරගත යුතුය. |
| (ආ) | අක්‍රීය ණය ශේෂ ලේඛනයේ ඇතුළත් නිළධාරින් 104 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.1,565,677 ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂයන් කඩිනමින් අය කරගත යුතුය. |
| (ඇ) | දිවා, රාත්‍රි සේවය සපයන ගිනි නිවීමේ අංශය සඳහා මූලික ගිනිහට, පළමු පෙළ ගිනිහට හා මෝටර් යාන්ත්‍රික ගිනිහට යන ප්‍රධාන සේවා කාණ්ඩ 02 ට අයත් අනුමත ගිනිහට නිලධාරීන් 06 දෙනෙකුගේ තනතුරු 2014 වර්ෂයේ සිට පුරප්පාඩු පැවතුණි. | තනතුරු පුරප්පාඩුව පිරවීමට අනුමැතිය ඉල්ලා ඇති අතර මූලික ගිනිහට හා පළමු පෙළ ගිනිහට තනතුරට දැනට ආයතනයේ සේවය කරන යාන්ත්‍රික ගිනිහට තනතුර දරන්නන්ගේ උසස්වීම් බැවින් ඔවුන්ගේ සේවා කාලය සම්පූර්ණ වීමේ දී විධිමත්ව පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇති බව. | පුරප්පාඩු තනතුරු පියවීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එන්ජිම අළුත්වැඩියා නොකිරීම නිසා වාහන 11 ක් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර එම වාහන දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ | එගොඩඋයන, කොරළවැල්ල, අගුලාන ආදාහනාගාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා | ඵලදායි කාර්යයක් සඳහා යොදවා ගැනිමට කටයුතු කළ |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුමේ රු.7,137,020 ක ශේෂයක් පවතින අතර, නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවය මත එම මුදල් එලදායි කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි. | මෙම මුදල් යොදා ගැනීමට තීරණය කර ඇති අතර මේ වන විට කොරළවැල්ල පොදු සුසාන භූමියේ අළුත්වැඩියා කටයුතු සඳහා සභා අරමුදලින් වැය කර මුදල රු.1,860,879.46 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යුනු ලබන ගිණුමෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | යුතුය. |
| (ඇ) | ලුනාව තානායම පිහිටා තිබූ සභාව සතු හෙක්ටයාර් 0.7063 ක් විශාල ඉඩම මහල් නිවාස ව්‍යාපෘතියක් සඳහා නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය වෙතින් සභාව වෙත වන්දි මුදල් අයවී නොතිබුණි. | 2014.11.17 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන මගින් ලුනාව මහල් නිවාස සංකීර්ණය සඳහා වන්දි ගෙවීමට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව භාණ්ඩාගාර අරමුදල් ලබා ගැනිම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත අනුමැතිය ලබා දී ඇතත්, මෙතෙක් එම මුදල් අප වෙත ලැබී නොමැත. මේ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය හා නීතිපතිද දැනුවත් කර ඇති බව. | ලැබිය යුතු වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලක්ෂපතිය ප්‍රදේශයේ ළමා හා මාතෘ සායන ගොඩනැගිල්ලේ උඩුමහලේ පුස්තකාලයක් ස්ථාපිත කිරීම සඳහා රු.237,599 ක් වටිනා උපකරණ 2019 හා 2021 වර්ෂවල මිලදීගෙන තිබුණද පුස්තකාලයක් ස්ථාපිත කර නොතිබූ අතර ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | නිශ්ක්‍රිය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභා බල ප්‍රදේශයට අයත් වීර පුරන් අප්පු රථගාලෙහි වැඩ අවසන් කර සභාව වෙත භාරදී වර්ෂ 2 ½ ක් ගත වී ඇතත් රථගාල බදු දී ආදායම් උපයා ගැනීමට සභාව කටයුතු කර නොතිබූ අතර නඩත්තු කටයුතු සඳහා දෛනිකව සේවකයන් තිදෙනෙකුට හා පුද්ගලික ආරක්ෂක සේවකයන් දෙදෙනෙකුට වැටුප් ගෙවා තිබුණි. | 2023.03.28 දිනැති කළමනාකරණ කමිටු තීරණය පරිදි මෙම ස්ථානයෙන් කොටසක් සභා සේවකයන්ගේ වාහන ගාල් කිරීම සඳහා වෙන් කර ඉතිරි කොටස සභා සේවකයෙකු මගින් අවසර පත්‍රයක් ලබා දී ගාස්තු අයකර බාහිර පාර්ශවයන් වෙත වෙන් කර දීම සඳහා ක්‍රමවේදයක් සැකසීමේ කටයුතු වර්මානය වන විට සිදුකෙරෙමින් පවතින බව. | නිශ්ක්‍රිය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඩික්සන් ජේ පීරිස් ක්‍රීඩාංගනයේ ක්‍රීඩා මණ්ඩප ගොඩනැගිල්ල අබලන්ව පැවති අතර එයට යාබදව ඉදිකර ඇති ළමා උද්‍යානයද දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ඉදිරියේ දී ප්‍රතිපාදන ලැබෙන අයුරින් මෙම ක්‍රීඩාංගන ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන බව. | -එම- |

**3.4** වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන ධාවනය සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතු වුවද සභාව සතු වාහන 03 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගෙන නොමැති වාහන සංඛ්‍යාව 03 ක් බව. | ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වාහන අදාළ රියදුරු වෙත භාර දිමේදී ලිඛිතව භාර දිමට කටයුතු කළ යුතු වුවත්, මහා නගර සභාවට අදාළ වාහන රියදුරන් වෙත භාර දිමේදී ලිඛිත පැවරීමක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වාහන රියදුරු වෙත ලිඛිතව පැවරීමට කටයුතු කළ යුතුවේ. |